# WEATHER FORECAST FOR 30 NOVEMBER 2019

(Issued at 05.30 a.m. on 30 November 2019)

**Prevailing showery condition over the island (particularly in Northern, North-Western, Sabaragamuwa, Western and Central provinces and in Anuradhapura district) is expected to further enhance today (30 November).**

Showers or thundershowers will occur at times in Northern, Eastern, North-Central, Uva, Central and Southern provinces. Showers or thundershowers will occur elsewhere after 1.00 p.m.

Heavy showers about **100-150** mm are likely at some places in Northern, North-Western, Sabaragamuwa, Western and Central provinces and Trincomalee and Anuradhapura districts. (Jaffna, Kilinochchi, Mullaitivu, Mannar, Puttalam, Kurunegala, Gampaha, Rathnapura, Kegalle, Kandy, Nuwara-Eliya, Anuradhapura and Matale districts)

Fairly heavy showers about **100** mm are likely at some places elsewhere (particularly in Southern and Uva provinces and Batticaloa and Ampara districts).

Misty conditions can be expected at some places in Western and Sabaragamuwa provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

දිවයින පුරා (විශේෂයෙන්ම උතුරු, වයඹ, සබරගමුව, බස්නාහිර සහ මධ්‍යම පළාත්වල සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ) පවතින වැසි තත්ත්වයේ තවදුරටත් වැඩි වීමක් අද දින (නොවැම්බර් 30) බලාපොරොත්තු වේ.

උතුරු, නැගෙනහිර, උතුරු-මැද, ඌව, මධ්‍යම සහ දකුණු පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර සෙසු ප්‍රදේශවල ප.ව. 1.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

උතුරු, වයඹ, සබරගමුව, බස්නාහිර සහ මධ්‍යම පළාත්වලත් ත්‍රිකුණාමලය සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී.100-150 පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැක. (යාපනය, කිලිනොච්චි, මුලතිවු, මන්නාරම, පුත්තලම, කුරුණෑගල, ගම්පහ, රත්නපුර, කෑගල්ල, මහනුවර, නුවර-එළිය, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්ක)

සෙසු පළාත්වල (විශේෂයෙන්ම දකුණු සහ ඌව පළාත්වලත් මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල) ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තරමක් තද වර්ෂාපතනයන්ද ඇති විය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වල උදෑසන කාලයේදී ඇතැම් ස්ථානවල මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 30 November 2019)

Showers or thundershowers will occur at times in the sea areas extending from Mannar to Galle via Kankasanturai, Trincomalee and Potuvil. Showers or thundershowers will occur in the other sea areas in the afternoon or night. Heavy falls may occur at some places in the sea areas around the island.

Winds will be easterly to south-easterly in the sea areas extending from Mannar to Potuvil via Kankasanturai and Trincomalee and southerly to south-westerly in the other sea areas around the island.

Winds speed will be **(20-40)** kmph in the sea areas around the island and the sea areas will be fairly rough at times as the wind speed can increase up to **50** kmph at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය

2019 නොවැම්බර් මස 30 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.

මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ පොතුවිල් හරහා ගාල්ල දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට තද වැසිද ඇති විය හැක.

මන්නාරම සිට කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං නැගෙනහිර සිට ගිනිකොණ දක්වා වන දිශා වලින් හමන අතර සෙසු මුහුදු ප්‍රදේශ වල සුළං දකුණේ සිට නිරිත දක්වා වන දිශා වලින් හමනු ඇත.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (20-40) පමණ වන අතර සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/11/30
Time : 0600 hrs
DISASTER MANAGEMENT CENTRE